# Abstract No 57

## මහාබෝධිවංශ ග්‍රන්ථිපදවිවරණයේ භාෂාව විෂයයෙහි සංස්කෘතයේ බලපෑම

**නීල් පුෂ්පකුමාර,**
කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
emnpkumara@gmail.com

මෙම පර්යේෂණ පත්‍රයෙන් පොලොන්නරු යුගයෙහි රචිත මහාබෝධිවංශ ග්‍රන්ථිපදවිවරණයෙහි භාෂාව විෂයයෙහි සංස්කෘතයේ බලපෑම විමසෙයි. මහාබෝධිවංශ ග්‍රන්ථිපදවිවරණයේ හෙවත් මහාබෝධිවංශ ගැටපදයේ භාෂාව සකස් කර ගැනීමේ දී සංස්කෘත භාෂාවෙන් කවරාකාරයේ බලපෑමක් ලැබුණේ ද? ඒ කිනම් අංශ කෙරෙහි ද? ඒ සඳහා හේතු වූ කරුණු කවරේ ද? යනු මෙහි පර්යේෂණ ගැටලුවයි. මූලික වශයෙන් මහාබෝධිවංශ ග්‍රන්ථිපදවිවරණය මත පදනම් වන මෙම අධ්‍යයනය තත් කෘතියෙන් හෙළි වන භාෂාමය සාධක කෙරෙහි පමණක් සීමා වන්නකි. තත් කෘතිය රචනා වන අවධියෙහි සාංස්කෘතික, සමාජ, ආගමික හා දේශපාලන වශයෙන් වූ බලපෑම හේතුවෙන් සිංහල භාෂාව කෙරෙහි සංස්කෘත භාෂාව දැඩි ව බලපෑවැත් වූ බව පෙනෙයි. මෙහි දී ප්‍රාථමික මූලාශ්‍රය මගින් අනාවරණය කර ගන්නා කරුණු ද්විතීයික මූලාශ්‍රය ද අදාළ පරිදි ඇසුරු කරමින් තුලනාත්මක ව සංසන්දනය කර බැලෙයි. ඒ අනුව භාෂාමය වශයෙන් සංස්කෘතයෙන් වූ බලපෑම නිශ්චිත වශයෙන් නිගමනය කළ හැකි අවස්ථාවන්හි ඒ බව සඳහන් කරන අතර නිශ්චිත නිගමනයක් දීමට අපොහොසත් අවස්ථාවන්හි වඩාත් පිළිගත හැකි අදහසක් ඉදිරිපත් කෙරෙයි.

**ප්‍රමුඛපදඃ-** මහාබෝධිවංශ ග්‍රන්ථිපදය, භාෂාව, සංස්කෘත බලපෑම